## ස්වර්ණ ප්‍රදීප උකස් ණය සේවාව

මහජන බැංකුවේ ස්වර්ණ ප්‍රදීප උකස් සේවාව ඔබට, ඔබගේ හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් සඳහා ඉක්මන්, විශ්වාසනීය සහ රහස්‍ය සේවාවක් ලබාදෙන අතරම ඔබගේ වටිනා රන් ආභරණ සඳහා උපරිම ආරක්ෂාවක් ද ලබාදේ.

විශේෂ ප්‍රතිලාභ

- කොටස් වශයෙන් වාරික ගෙවීමේ හැකියාව (මහජන බැංකු ශාඛා/සේවා මධ්‍යස්ථාන මඟින්, KIOSK යන්ත්‍ර මඟින් ඩිජිටල් පහසුකම් මඟින්)
- දිවයින පුරා විසිරුණු ශාඛා හා සේවා මධ්‍යස්ථාන 745 ක සුවිශේෂී සේවාව
- අවම පොලී අනුපාත
- වනිතා වාසනා ගිණුම් හිමියන් සහ අස්වැන්න ගිණුම් හිමියන් සඳහා වන සහන පොලී අනුපාතිකය

## සුදුසුකම්/යෝග්‍යතාවය

- අවුරුදු 16 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙකුවීම.
- නීතිමය වශයෙන් පිළිගත හැකි අවශ්‍යතාවයක් වීම.
- පුද්ගලික පරිහරණය සඳහා පමණක් යොදා ගනු ලබන රන් භාණ්ඩ

## ලබාදිය යුතු ලියවිලි

ජාතික හැඳුණුම්පත - (ජාතික හැඳුණුම්පතක් (NIC ) නොමැති නම්, වලංගු රියදුරු බලපත්‍රයක් හෝ විදේශ ගමන් බලපත්‍රයක්, ලිපිනය සනාථ කරන ලියවිල්ලක් සමඟ ඉදිරිපත් කළ හැකිය. ජාතික හැඳුණුම්පතෙහි අංකය එහි සඳහන්වී තිබීම අත්‍යවශ්‍ය වේ.

## අදාල පොලී අනුපාතය

www.peoplesbank.lk **වෙබ් අඩවිය ඔස්සේ තොරතුරු ලබාගත හැකිය.**

## කාල සීමාව

වසරක් සඳහා ප්‍රදානය කරනු ලබයි.

## ගාස්තු/කොමිස්,පොලී ආදිය

- රු.25,000/- අඩු උකස් අත්තිකාරම් සඳහා අත්තිකාරම් මුදා ගැනීමේදී අවම දින 30 ක් සඳහා පොලිය ගණනය කෙරේ.
- රු.25,000/- වැඩි උකස් අත්තිකාරම් සඳහා අත්තිකාරම් මුදා ගැනීමේදී අවම දින 07 ක් සඳහා පොලිය ගණනය කෙරේ.
- ගිවිසගත් කාලය තුළ (මාස 12 ක් ඇතුළත) පියවා නොගන්නේ නම්, පැහැර හැරීමේ දිනයේ සිට නැවත පියවීමේ දිනය දක්වා 2% ක දඩ පොලියක් අය කෙරේ.

**අයදුම් කළහැකි ආකාරය**

දිවයින පුරා පිහිටි ශාඛා අතරින් ළඟම ඇති මහජන බැංකු ශාඛාවට හෝ සේවා මධ්‍යස්ථානය විසිත්ත කර කාර්ය මණ්ඩලය සමඟ අවශ්‍යතාවය සාකච්ඡා කිරීම මඟින් මෙම පහසුකම ලබාගත හැකිය.

**නියමයන් සහ කොන්දේසි**

- උකස් අත්තිකාරම නියමිත පොලී සමඟ වසරක් ඇතුළත ආපසු ගෙවිය යුතුය.
- එකඟවූ කාලසීමාව තුළ නිරවුල් නොකළහොත් උකස් කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුවේ.
- උකස් රිසිට්පත අස්ථානගතවූ අවස්ථාවේදී හෝ උකස්කරු මියගිය විට බැංකුව විසින් නිකුත් කරන ලද අනුමත ආකෘති පත්‍රය, දිවුරුම් පෙත්සම සමඟ අදාල ලියවිලි ලබාදිය යුතුය.

**පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පරිපාටිය**

- ගැණුම්කරුට info@peoplesbank.lk වෙතින් ප්‍රවේශ වියහැකිය.

- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

**වැඩිදුර තොරතුරු**

www.peoplesbank.lk වෙත පිවිසෙන්න
ඇමතුම් මධ්‍යස්ථානය - 1961
ප්‍රධාන කාර්යාලය - 0112481481 - 8064/8054